# ලාංකේය ටෙලිනාට්‍ය කලාව සඳහා ඉන්දියානු හින්දී ටෙලිනාට්‍ය මගින් වන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

*ලියනගේ, ශාලිකා ශෙහානි* [1]

ශ්‍රී ලාංකේය ටෙලිනාට්‍ය කලාව විශේෂයෙන් ඉන්දියානු ටෙලිනාට්‍ය කලාවේ බලපෑමට ලක්වන හෙයින් වත්මන් ටෙලිනාට්‍ය මිනිස් සිතට බෙහෙවින් බලපෑම් ඇති කරයි. මෙම ටෙලිනාට්‍ය හරහා ලාංකේය නව ටෙලිනාට්‍යද බලපෑමට ලක්ව ඇත. හඬකවන ලද හින්දී ටෙලිනාට්‍ය හරහා දේශීය නාට්‍යයන්ද හින්දී නාට්‍ය ආභාසය ගෙන ඇත. ඉන්දීය නාට්‍ය අනුකරණය කරමින් ලාංකේය ටෙලිනාට්‍යයන් බොහොමයක් නිර්මාණය වේ. ටෙලිනාට්‍ය මගින් ඉටුවිය යුතු සේවාව පිළිබඳව නොසලකා, ඉන්දීය ටෙලිනාට්‍ය අනුකරණය සහ හඬකවා ප්‍රචාරය කිරීම, ලාංකේය ටෙලිනාට්‍ය කලාවට කවරාකාරයෙන් බලපෑම් සිදු කරන්නේද? යන්න සොයා බැලීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ. මෙම අධ්‍යයනය සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ අහඹු ලෙස තෝරාගත් පුද්ගලයින් 50 දෙනෙකු සම්බන්ධ කරගන්නා ලදි. අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත උපයෝගී කර ගන්නා ලද අතර ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම ඇති පුද්ගලයින්ගේ තොරතුරු ලබා ගන්නා ලදි. ප්‍රථමයෙන්, අවශ්‍ය දත්ත සහ තොරතුරු පිළිබඳව සොයා බැලීමට ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය භාවිතා කර ඇත. ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත ඉදිරිපත් කිරීම සඳහා වගු, ප්‍රස්තාර භාවිතා කර ඇති අතර, දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාත ක්‍රම භාවිතා කර ඇත. ඉන්දියානු හින්දී ටෙලිනාට්‍ය සහ ලාංකේය ටෙලිනාට්‍ය නරඹන සංඛ්‍යාව ලබාගැනීම සඳහා නරඹන වාර ප්‍රමාණය අනුව ප්‍රමාණාත්මක විශ්ලේෂණය භාවිත කර ඇත. දත්ත විශ්ලේෂණය අනුව ලංකාව තුළ ඉන්දීය හින්දී ටෙලිනාට්‍ය විකාශනයෙහි වර්ධනයක් වී ඇති අතර පරිගණක දත්ත වාර්තාවන්ට අනුව 2014, 2015 සහ 2016 යන වර්ෂ වල 30%, 38% සහ 44% යන ප්‍රමාණයට විකාශනය සිදුව ඇත. මෙම ටෙලිනාට්‍ය 60% වැනි ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් යටතේ ක්‍රියාත්මක වෙයි. සමාජයක් වශයෙන් ගත් කල මෙම ඉන්දීය හින්දී ටෙලිනාට්‍ය රැල්ල මගින් ලාංකේය ටෙලිනාට්‍ය සඳහා බලපෑම් කරන බව පෙනී යයි.

**ප්‍රමුඛ පද:** ටෙලිනාට්‍ය, විශ්ලේෂණය, හින්දී, ලාංකේය සමාජය

[1] *ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, ජනසන්නිවේදන අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*issheha@gmail.com*